# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1976/3 - 2016 ජූලි මස 18 වැනි සඳුදා - 2016.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සකස්කර 1989.04.17 වැනි දින අංක 554/5 දරන *අති විශේෂ ගැසට්පත්‍රය* මගින් ප්‍රකාශයටපත් කර ඇති 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 178(3) ඡේදයෙන් ඉක්බිතිව පහත සඳහන් නියමය ඇතුළත් කළ යුතු බවට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171, 173 සහ 184 වගන්ති අනුව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය, සරත් ඒකනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
ප්‍රධාන හා පළාත් පාලන
විෂයභාර අමාත්‍ය,
මධ්‍යම පළාත.

2016 ජූලි මස 07 වැනි දින,
ප්‍රධාන හා පළාත් පාලන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත් සභාව,
පල්ලේකැලේ දී ය.

නියමය

තවද, යම් ප්‍රාදේශීය සභාවක් කර්මාන්ත ඉටුකිරීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (භාණ්ඩ හා වැඩ) 3 : 9 : 1 හා 3 : 9 : 2 ඡේදවල සඳහන් විධිවිධාන පරිදි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 1/2012 හි සඳහන් විධිවිධාන පරිදි කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

08-15


1A - PG 3022 — 107 (2016/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*